@



## “අවුරුදු 30කට පසුව ඇසුණු හොඳම ප්‍රවෘත්තිය මේකයි” - *ගරිල්ලා ත්‍රස්තවාදය” පිළිබඳ විශේෂඥ විශ්ලේෂක රොහාන් ගුණරත්න*

**කීර්තිමත් ආරක්ෂක විශ්ලේෂකයකු වන ආචාර්ය රොහාන් ගුණරත්න සමග “එල්ටීටීඊයේ පරාජය” හා ඉන්පසු තත්ත්වය පිළිබඳ කළ කතාබහකි මේ.**



ප්‍ර : එල්ටීටීඊ ත්‍රස්තබලය මුළුමනින්ම අඩපණ කරමින්, අපේ ආරක්ෂක අංශ ලබාගත් සුවිශේෂී ජය ග්‍රහණය ඔබ කියවන්නේ මොන විදිහටද?

පි : මෙහෙමයි. අවුරුදු 30 ක කාලයක් තිස්සේ එල්ටීටීඊය, ශ්‍රී ලංකා රජය, ඉන්දීය රජය හා ජාත්‍යන්තර ප්‍රජාව සමග සටනක නිරතව සිටිනවා. පැහැදිලිවම එල්ටීටීඊය කියන්නේ ජාත්‍යන්තර ත්‍රස්තවාදී සංවිධානයක්. මේ වන විට අපේ ආරක්ෂක අංශ යුදමය වශයෙන් සම්පූර්ණයෙන්ම එල්ටීටීඊය පරද වලා තියෙනවා. නමුත් මේක යුදමය වශයෙන් ලබාගත් ජයග්‍රහණයක් පමණයි. මේ ජයග්‍රහණය තවදුරටත් සුරක්ෂිත කර ගැනීමට නම් ලංකාණ්ඩුව කාරණා තුනක් ඉෂ්ට කළ යුතුයි. පළමුවෙන්ම ඉන්දියාව හා දෙමළජනතාව සමග බොහෝම සමීප සබඳතාවක් ලංකාණ්ඩුව ගොඩනගා ගත යුතුයි. ඒ විදිහේ යහපත් සබඳතාවක් ගොඩනගා ගත්තේ නැත්නම් නැවතත් ත්‍රස්තවාදී කටයුතුවලට ඒ අය උදව් ආධාර කරන්න පුළුවන්. මේ වන විට සෑහෙන ඉහළ යුදමය ශක්තියක්, අපට තියෙනවා. නමුත් ඊට සමගාමීව අපේ ඔත්තු සේවය තවදුරටත් දියුණුවීම වැදගත්. ප්‍රබල ඔත්තු සේවයක් අපට අවශ්‍යයි. දැනට තිබෙන ඔත්තු සේවය ගත්තොත් ඒක එතරම් ශක්තිමත් එකක් නෙවෙයි. අපේ හමුදා බුද්ධි සේවාව හොඳයි. නමුත් ජාතික ඔත්තු සේවාව බොහෝම අඩපණයි. ඒක ඉතාමත් ශක්තිමත් විදිහට ගොඩනැගිය යුතුයි. ඒක හැදුවේ නැත්නම්, ත්‍රස්තවාදයෙන්, ලංකාවට වෙන හානි කල්තියා හඳුනාගන්න බැහැ. නමුත් බලවත් ඔත්තු සේවාවක් තිබුණහොත්, කල්තියා අපට අනතුර හඳුනාගත හැකියි. ඒ එක්කම මේ සුවිශේෂී මොහොතේ දී පොදු ජාතික ඒකාග්‍රතාවක් රට තුළ ගොඩනැගීම කියන කාරණයත් අනිවාර්යය අවශ්‍යතාවක්. එහෙම නැතිව සිංහල මිනිස්සු සිංහල විදිහට හිතලා ක්‍රියා කළොත්, ද්‍රවිඩ මිනිස්සු ද්‍රවිඩ විදිහට හිතලා ක්‍රියා කළොත් එක රටක් ගොඩනැගෙන්නේ නැහැ. ඒ නිසා ජාති, කුලමල, ආගම්භේද අමතක කොට රට ගොඩනැගීමට සියලු දෙනා අධිෂ්ඨානශීලී විය යුතුයි. යුදමය වශයෙන් ත්‍රස්තවාදී සංවිධානය පරාජය කිරීම බොහෝම හොඳ දෙයක්. ඒ ගැන කිසි ගැටලුවක් නැහැ. අවුරුදු 30 කට පසුව ලංකාවේ වැසියන්ට අහන්න ලැබුණු හොඳම නිව්ස් එක ඒකයි. නමුත් එයින් ප්‍රතිඵල ලැබෙන්නේ අර කලින් කිව්ව විදිහට හිතුවොත් විතරයි.

ප්‍ර : මීට පෙරත් කිහිප අවස්ථාවක දීම අපි එල්ටීටීඊයත් එක්ක යුද්ධ කළා. මේ ශක්තීන් අපට තිබුණා. නමුත් මේ විදිහේ අධි සාර්ථකත්වයක් ලබාගන්න මීට පෙර අපිට නොහැකි වුණා. මේ යුද්දේ දිනන්න පුළුවන් වුණේ කොහොමද?

පි : මේ ජයග්‍රහණයට මේ තීරණාත්මක වෙනසට බලපෑ ප්‍රධාන කාරණය විදිහට මම දකින්නේ ගෝඨාභය රාජපක්ෂව ආරක්ෂක ලේකම් තනතුරට පත් කිරීමයි. එයාට මේ යුද්ධය පිළිබඳ බොහෝම හොඳ අවබෝධයක් තිබුණා. යුද හමුදාවට විතරක් මේ යුද්ධය කරන්න බැහැ කියන අවබෝධය ඔහුට තිබුණා. මේක සාර්ථක කර ගැනීමට නම් නාවික හමුදාව, ගුවන් හමුදාව, පොලිසිය, ඔත්තු සේවාව, සිවිල් ආරක්ෂක අංශය සහ විදේශ කටයුතු අමාත්‍යාංශ එක්විය යුතුය කියන කාරණය ඔහු තේරුම් ගත්තා. ඒ තේරුම් ගැනීම ඇතුළේ ඔහු ප්‍රබල කණ්ඩායමක් ගොඩනැගුවා. ඒක මේ යුද සාර්ථකත්වයට බලපෑ ප්‍රධානතම කාරණය විදිහට මම දකිනවා.

ඊළඟට කරුණා එල්ටීටීඊයෙන් කැඩීමත් මේ ජයග්‍රහණයට තීරණාත්මකව බලපෑවා. කරුණා කියන්නේ සංග්‍රාමික යුද ඉතිහාසය තුළ එල්ටීටීඊයට හිටපු දක්ෂතම සෙනෙවියෙක්. උතුරු නැගෙනහිර ප්‍රදේශවල ගහ කොළ සතා, සිව්පාවා ගැන මනා අවබෝධයක් ඔහුට තිබුණා. කරුණාව, එල්ටීටීයෙන් කඩන්න නායකත්වය දුන්නේ රනිල් වික්‍රමසිංහ. සාම සාකච්ඡා සඳහා ලංකාවෙන් පිටට ගිය පසු කැලෑවට පිටතින් දියුණු ලෝකයක් තිබෙන බව කරුණා තේරුම් ගත්තා. එයාට ඒ වැටහීම ලැබුනේ සාම සාකච්ඡා නිසයි. ඊළඟට මේ යුද්ධයේ දී නාවික හමුදාවෙන් ලැබුණු දායකත්වයත්, සෑහෙන ඉහළ තැනක තිබුණා. වසන්ත කරන්නාගොඩ නාවික හමුදාපතිවරයාව ගත්තොත් එයා යුදමය වශයෙන් පමණක් හිතන කෙනෙක් නෙමෙයි. නායකයෙක් විදිහට එයාට වෙනත් විදිහටත් හිතන්න පුළුවන්. එයා හිතන්නේ සාම්ප්‍රදායික විදියට නෙමෙයි. පළමුවැනි වතාවට දියාගෝ ගාර්ෂියාව, ඔස්ට්‍රේලියාව, ඉන්දුනීසියාව, ආසන්නයට ගිහින්, ජාත්‍යන්තර මුහුදු සීමාවට ගිහින් එල්ටීටීඊ නෞකා විනාශ කිරීමට ඔහු කටයුතු කළා. මීට පෙර ජාත්‍යන්තර මුහුදට ගිහින් එල්ටීටීඊ නැව්වලට ගැහුවේ නැහැ. ඒක ප්‍රවේශමෙන් කළ යුතු දෙයක්. නමුත් වසන්ත කරන්නාගොඩ ඒක දක්ෂ ලෙස කළා. ඒ වෙනුවෙන් වෙනම ම කාර්ය සාධක බළකායක් ඔහු පිහිටෙව්වා. ඒක මේ යුද්ධයේ තීරණාත්මක වෙනසක් ඇති කළ අවස්ථාවක්. කොටි නෞකා විනාශ කිරීම තුළ අවි ආයුධ නොලැබීම ඇතුලේ අපේ හමුදාවන්ට එල්ටීටීඊය එක්ක මුහුණට මුහුණ සටන් කිරීමට පහසුවෙන් හැකියාව ලැබුණා.

ඊළඟට සරත් ෆොන්සේකා කියන්නේ අතිදක්ෂ සෙන්පතියෙක්. “බට්ටා ඉස්සරහා ෆොනි පස්සේ” කියලා බොහෝම ජනප්‍රිය කියමනක් යුද හමුදාව තුළ තියෙනවා. ඔහු ඒ තරමට දැඩි, යුද්ධයට කැපවුණු, නිරන්තර සෝදිසියෙන් සිටින ප්‍රායෝගික නිලධාරියෙක්. ඒ එක්කම සටන්බිමේ අත්දැකීම් එක්ක මේ යුද්ධය පිළිබඳ මනා වැටහීමක් ඔහුට තිබුණා. මීට පෙර අවස්ථාවල දී යුද හමුදාව ගමන් කළේ ඒ - 9 මාර්ගය ඔස්සේ රට මැදින්. නමුත් මෙවර හමුදාව දෙපැත්තෙන් මුහුදට සමාන්තරව ගමන් කළා. ඒ විදිහට උපාය උපක්‍රමයන් පවා මේ වතාවේ ගොඩක් වෙනස් කර තිබුණා.

ගුවන් හමුදාපති, රොෂාන් ගුණතිලකව ගත්තොත් ඔහු ඉතාම දක්ෂයෙක්. මේ යුද්ධය නිසාවෙන් ඔහුට තමන්ගේ මල්ලි පවා නැතිවුණා. ඔහුට යුද්ධය පිළිබඳ අමුතුවෙන් කියා දිය යුතු නැහැ. මේ විදිහට හැම පැත්තෙන්ම ගෝඨාභය හරි මිනිස්සුන්ව හොයාගත්තා. ජනාධිපතිගේ මල්ලී වීම ඇතුළේ ආරක්ෂක ලේකම්වරයා විදිහට කිසිම දේශපාලන පීඩනයකට හසු නොවී වැඩකිරීමට හැකියාවක් ගෝඨාභය ට ලැබුණා වගේම දේශපාලන පීඩනයන්, ත්‍රිවිධ හමුදාවට එල්ලවීමත් ඔහු වැළැක්වූවා.

ප්‍ර : ඔබ කියන්නේ මේ තරගයේ වීරයා “ගෝඨාභය” රාජපක්ෂ කියලද?

පි : ඔව්. මේ යුද්ධයේ වීරයා ගෝඨාභය. ඒ ගෞරවය ඔහුට හිමිවිය යුතුයි. ඔහු ඇතුළු ත්‍රිවිධ හමුදා ප්‍රධානින්ට ඔත්තු සේවාවේ නායකත්වයට ඉහළම රාජ්‍ය ගෞරවය, ජනාධිපතිතුමා ලබා දිය යුතුයි. ඒ එක්කම ජීවිතාන්තය තෙක් මේ සියලු දෙනාට අවශ්‍ය රැකවරණ ලබා දීමත්, ආණ්ඩුවේ වගකීමක්. එල්ටීටීඊය කියන්නේ පළිගැනීමේ නොනිමි ආශාවෙන් පෙළෙන සංවිධානයක්. යුද්ධයෙන් එල්ටීටීඊ නායකයෝ මියගිහින් තිබුණාට ඉතිරි වූ සාමාජිකයන්ගේ වෛරය මේ ඉහළ නිලධාරින්ට එල්ල විය හැකියි.

ප්‍ර : මේ යුද සාර්ථකත්වයට දේශපාලන නායකත්වයෙන් ලැබුණ තල්ලුව ගැන මොකද කියන්නේ?

පි : මේ යුද සාර්ථකත්වයට අවශ්‍ය දේශපාලන නායකත්වය, ජනාධිපතිතුමාගෙන් නොඅඩුව ලැබුණා. එතුමා හරි පුද්ගලයන්ව හරි තැන්වලට දැම්මා. යුද්ධය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ජනාධිපතිතුමාට නොතිබුණාට ඒ පිළිබඳ හැඟීමක් උනන්දුවක් එතුමාට තිබුණා. ඒ හැඟීමෙන් එතුමා හරි පුද්ගලයෝ, හරි තැන්වලට දැම්මා. දැන් යුද්ධයේ ආක්‍රමණශීලී තත්ත්වය ඉවරයි. දෙමළ ජනතාවත් එක්ක යහපත් සම්බන්ධයක් පවත්වාගෙන යෑමට නිවැරදි පුද්ගලයන් යොමුකිරීම මේ මොහොතේ එතුමා විසින් සිදු කළ යුතු අනිවාර්යය අවශ්‍යතාවක්. ද්‍රවිඩ ජනතාවගේ හිත් දිනා ගත්තේ නැත්නම් වෙනත් මුහුණුවරකින් ත්‍රස්තවාදය නැවත මතුවෙන්න පුළුවන්. ඒ සමගම ජාතිවාදය පාවිච්චි කොට බලයට පැමිණීමට උත්සාහ දරන දේශපාලන පක්ෂවලට දේශපාලනඥයන්ට මතුවීමට ඉඩ නොදීමත් වැදගත්. සිංගප්පූරුවේ මේ තත්ත්වය දකින්නට තියෙනවා. අනිවාර්යයෙන්ම ආගම හා ජාතිය කියන්නේ බොහෝම පෞද්ගලික දෙයක්. ඒක මිනිස්සුන්ට බොහෝම ළඟ දෙයක්.

ප්‍ර : ප්‍රභාකරන්ගේ මරණය ඔහුගේ අවසානය පිළිබඳ විවිධ කතා පැතිරෙනවා. ඒ පිළිබඳව ඔබ මොකද කියන්නේ...

පි : ප්‍රභාගේ මරණය අබිරහසක්, ඔහුගේ මරණය හිට්ලර්ගේ මරණය වගේ වෙයි කියලා ගොඩ දෙනෙක් හිතුවා. ඇත්තටම

ප්‍රභාකරන් කියන්නේ හීනෝන්මාදයෙන් පෙලුන පුද්ගලයෙක්. හැමවිටම ඔහු තමන් ගැන හිතපු මිනිහෙක්. තමන්ගේ ශරීරයේ පොඩි කොටසක් හෝ සතුරාට යනවාට ඔහු කැමැති වුනේ නැහැ. සතුරට ශරීරයේ සුළු කොටසක් හෝ අහු නොවන සේ, තමන්ගේ සිරුර පුලුස්සන්න කියලා ඔහු උපදෙස් දීලා තිබුණා. මීට පෙරත් ඔහු එහෙම උපදෙස් දීලා තියෙන වා. එදා ඉන්දියන් හමුදාව, ඔහුව වටකරලා තිබුණ වෙලාවේ පවා ඉන්ධන කෑන් එකක් අතැතිව පෞද්ගලික ආරක්ෂකයෙක් ඔහු අසල හිටියා. හිට්ලරුත් එහෙමයි. හිට්ලර්ගේ මෘතදේහය හොයා ගන්නත් බැරිවුණා. ප්‍රභාකරන් තමන්ගේ මරණය සැලසුම් කරලා තිබුණේ ඒ විදිහටයි. නායකයෙක් විදිහට තම උරුමය, කීර්තිය රැක ගැනීමට ප්‍රභාකරන් අනිවාර්යයෙන්ම උත්සාහ ගන්න ඇති. ඔහුගේ මෘතදේහය හමුදාවට අසුවුණා නම්, ඔහුව හමුදා අත්අඩංගුවට පත් වුණා නම් කිසිම විටෙක ඒ කීර්තිය ප්‍රභාකරන්ට ලැබෙන්නේ නැහැ. ත්‍රස්තවාදී සංවිධානයක් වුණාට එල්ටීටීඊය තුළ වැඩකෙරන්නේ නිකායක වගෙයි. ප්‍රභාකරන් කියන්නේ ත්‍රස්තවාදී නායකයෙක් වුණාට නිකායවාදී නායකයෙක්. නිකායක් විදිහට වැඩ කරත්දී රැකගත යුතු මූලධර්ම ගණනාවක් තියෙනවා. රහස්‍යභාවය කියන්නේ එයින් වැදගත්ම මූලධර්මයක්. නමුත් අවසානයේ ප්‍රභාකරන්ට තමන්ගේ මරණය අභිරහසක් කිරීමට නොහැකි වුණා. බුද්ධාගමේ තියෙනවා දිට්ඨ ධම්ම වේදනීය කර්මය කියල දෙයක්. ප්‍රභාකරන්ට මේ එල දුන්නේ ඒක. ප්‍රභාකරන් කියන්නේ මිනිසුන්ගේ සතුට නැති කරපු මිනිස්සුන්ට ගොඩක් දුක් දීපු කෙනෙක්.

ප්‍ර- ප්‍රභාකරන් මිය ගියා කිව්වාට, ඔහුගේ මෘත දේහය සොයා ගත්තාට තවමත් ප්‍රභාකරන් මිය ගියා කියලා දෙමළ සමාජයේ සමහරු පිළිගන්නේ නෑ. විශේෂයෙන්ම ලංකාවෙන් පිට මේ තත්ත්වය වැඩි වශයෙන් දක්නට ලැබෙනවා...

පි- ඒක ස්වභාවිකයි. මේ තරම් දරුණු නාය යෑමකට ලක්ව තිබියදී තමන්ගේ අරගලය තවදුරටත් ජීවමානව තියාගන්න එල් ටීටීඊ එක එහෙම කියනවා. අනිත් අතට ඔහුව දෙවියෙක් වගේ අදහපු අයට මේ මරණය හිතාගන්නත් බැරි තරම්. නමුත් ඔහුගේ මරණය ස්ථිරයි. ඒ පිළිබඳව කිසිදු සැක සංකාවක් තියාගත යුතු නෑ.

ප්‍ර- එල්ටීටීඊය කියන්නේ ලෝකයේ දරුණුතම ත්‍රස්තවාදී සංවිධානයක් කියල කිව්වට මේ යුද්ධයේ දී ඒක මිථ්‍යාවක් බ ව පැහැදිලිව පෙනී ගියා. මාධ්‍ය මගින් පෙන්නපු තරම් යුදමය හැකියාවක් ඔවුන්ට නොමැති බව මේ යුද්ධයේ දී පැහැදිලිව පෙනී ගියා. ඒ ගැන ඔබ මොකද කියන්නේ?

පි- මෙහෙමයි. මේ යුද්ධයේ දී ක්‍රියාන්විතය ආරම්භ කළේ ලංකා ආණ්ඩුව. සාමාන්‍යයෙන් මීට පෙර නම් ක්‍රියාන්විතය පටන් ගත්තේ එල්ටීටීඊයයි. සාමාන්‍යයෙන් සෑම අවස්ථාවකදීම යුද්ධයක ජයග්‍රාහකයා වන්නේ ඉස්සරහට ගිහින් සටන් කරන අයයි. මේ යුද්දෙදී වඩාත් සක්‍රිය වුණේ ශ්‍රී ලංකා හමුදාවයි. වෙනදාට ඇටෑක් කරන එල්ටීටීඊයෙන් මෙවර තදබල ප්‍රති ප්‍රහාරයක් එල්ල නොවුණු තරම්. ඔවුන්ට ආයුධ තිබුණාට සටන්කරුවෝ හිටියේ නෑ. එල්ටීටීඊය ගැන ලොකු බයක් මිනිස්සුන්ට තිබුණා. එල්ටීටීඊය කියන්නේ පරාජයට පත් වෙන සංවිධානයක් කියලා මිනිස්සු කල් තියාම දැනගෙන තිබුණා. අනිත් අතට ජනතාවගෙන් එල්ටීටීඊයට තිබුණු ආදරයත් මේ යුද්ධය තුළ තිබුණෙ නෑ. සංවිධානයට බලහත්කාරයෙන් මිනිස්සු බඳවා ගැනීම ඇතුළේ ඒ ආදරය නැති වුණා. මේ සියල්ල එල්ටීටීඊයේ අවාසියට හිටියා.

ප්‍ර : අවසාන එල්ටීටීඊ සාමාජිකයා, නායකයාව ඝාතනය කළත් කේ. පී. තවමත් නිදැල්ලේ ඉන්නවා. ප්‍රභාකරන්, තමන්ගෙන් පසු සංවිධානය ඉදිරියට ගෙන යෑමේ වගකීම පවරා ඇත්තේ ඔහුට...

පි : කේ. පී. ගේ නායකත්ව ශෛලිය, ප්‍රභාකරන්ගේ නායකත්ව ශෛලියට වඩා වෙනස්. ඔහු මේ යුද්ධයට පවා සම්බන්ධ වුණේ වෙනස් විදිහටයි. යුද්ධයට අවශ්‍ය බඩුභාණ්ඩ, උපදෙස් වගේ දේවල් කේ. පී. ලබා දුන්නා. කොහොම නමුත් කේ. පී. කියන්නේ සාකච්ඡාවෙන් ප්‍රශ්න බේරාගන්න අකැමැති කෙනෙක් නෙමෙයි. ප්‍රභාකරන්, ලංකාවෙන් පිට ගිහිල්ලා තියෙන්නේ ඉන්දියාවට, සිංගප්පූරුවට, මැලේසියාවට විතරයි. ඒ නිසාම ප්‍රභාට ලෝකය පිළිබඳ හරි අවබෝධයක් නැහැ. නමුත් කේ. පී. එහෙම කෙනෙක් නෙමෙයි. කේ. පී. ඇමෙරිකාව ඇතුළු රටවල් කිහිපයක සංචාරය කරලා තියෙනවා. ඔහු බ්‍රිතාන්‍යයේ, ස්කැන්ඩිනේවියානු රටවල, මුම්බායේ. මද්‍රාසියේ, මැලේසියාවේ, තායිලන්තයේ, හොංකොංවල ජීවත් වෙලා තියෙනවා. ඒ නිසාම ලෝකය පිළිබඳ දියුණු අදහසක් ඔහුට තියෙනවා. දැන් එල්ටීටීඊයේ අතුරු නායකයා ඔහුයි. අනි වාර්යයෙන්ම, ඔහු යුද්ධය වගේම දේශපාලන කටයුතුත් නැවත දියත් කරන්න බලයි. නමුත් සංවිධානමය කඩාවැටීම ඇතුළේ ඉස්සර වගේ ත්‍රස්තවාදී වැඩකටයුතු කරන්න ඔහුට බැරිවේවි. නමුත් ඔහු නිකං ඉන්න එකක් නැහැ. ඒ නිසාම කේ. පී. ව අත්අඩංගුවට ගැනීමට අපේ ආරක්ෂක අංශ හදිසි ප්‍රමුඛතාව දී දැන් කටයුතු කළ යුතුයි. මේ යුද්ධයට සමගාමීව, මීට මාසයකට විතර කලින් ඒක ආණ්ඩුවට කරන්න තිබුණා. කොහොම වුණත් තවම ඒ වැඩේට පරක්කු නැහැ. යුද්ධයෙන් සියයට 90ක් දැන් ඉවරයි. නමුත් තව සියයට 10 ක් තියෙනවා. කේ.පී. ප්‍රධාන ජාත්‍යන්තර ජාලය අඩපණ කිරීමට ඒ සියයට 10 තුල අපි වග බලාගත යුතුයි. ඒක යුදමය වශයෙන් කරන්න බැහැ. ඔත්තු සේවාව, තානාපති සේවාව ආදී සියළු අංශ ඒකාබද්ධ කර ගනිමින් ඒ කටයුත්ත ක්‍රියාත්මක කල යුතුයි.

ප්‍ර : ලබාගත් මේ යුද ජයග්‍රහණ තහවුරු කිරීමට නම් වහාම කළ යුත්තේ මොකක් කියලද ඔබ යෝජනා කරන්නේ.

පි : ඔව්. මේ ත්‍රස්තවාදය නැති කිරීමට සටන් කළ හැම සොල්දාදුවකුටම උතුරු නැගෙනහිර ප්‍රදේශවලින් ඉඩමක් දිය යුතුයි. වගා කටයුතු සඳහා ඉඩම් ලබා දී ඒ අය ඒ පළාත්වල ජනාවාස කළ යුතුයි. ද්‍රවිඩ ජනතාවත් එක්ක සහයෝගයෙන් ජී වත් වීමට ඒ අයට ඉඩකඩ ලබා දීමට වගකිවයුත්තන් කටයුතු කිරීම ඇතුළේ යළිත් මේ විදියේ ප්‍රශ්න ඇති නොවීමට වගබලා ගත යතුයි.

ප්‍ර : යුද ජයග්‍රහණයෙන් අනතුරුව මේ ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් දිය යුතු බවට අදහසක් රටේ සමහරු අතර තියෙන වා. ඔබ මොකද මේ ගැන කියන්නේ?

පි : බොහෝ විට ලංකාවේ මේ ප්‍රශ්නය හැඳින්වෙන්නේ ජනවාර්ගික ප්‍රශ්නයක් කියලයි. නමුත් මේක වැරදි අදහසක්. ලංකාවේ සිංහල හා දෙමළ ජනතාව අතර කිසිම ප්‍රශ්නයක් නැහැ. භාෂාව, ආගම වගේ දේවල් වෙනස් වුණාට ගොඩක් දුරට අපේ ජීවන රටාවන් එක සමානයි. අනිත් අතට ලංකාව කියන්නේ බොහෝම පොඩි රටක්. ඒ පොඩි රට තුළ දෙමළ, සිංහල, මුස්ලිම් මිනිස්සු එකට ජීවත්වෙන්න යනවා නම් ෆෙඩරල් විසඳුම් වගේ දේශපාලන විසඳුම් අවශ්‍ය නැහැ. සුපැහැදිලිවම මේ මොහොතේ කළ යුත්තේ ජාතීන් අනුව වෙන් කිරීම නොවෙයි. මේ අවස්ථාවේ වඩාත් වැදගත් වන්නේ ශ්‍රී ලාංකිකයන්, ලෙස රටේ සියලු දෙනා කල්පනා කිරීමයි. දේශපාලනඥයන්, රටවැසියන් ඇතුළු සියලු දෙනා මේ සුවිශේෂී මොහොතේ සිට වත් ඒ පිළිබඳව කල්පනා කොට වැඩකිරීම වැදගත්. එවැනි පොදු සාමූහික වැඩපිළිවෙළක් ඇතුළේ වැඩ කරනවා වෙනුවට ජාතීන් අනුව වැඩකරන්න ගියොත් ලංකාවට අනාගතයක් නැහැ.

ප්‍ර : එල්ටීටීඊයේ මේ පරාජය දෙමළ "ඩයස්පෝරාව"ට මොන විදිහට බලපාවි ද?

පි : දෙමළ ඩයස්පෝරාව තුළ වැඩි පිරිසක් ඉන්නේ හොඳ මිනිස්සු. ඒ තුළ 10% ක් වගේ අතිශය අන්තවාදී ත්‍රස්තවාදයට සහාය දක්වන සුළු පිරිසක් ඉන්නවා. මේ මොහොතේ ජාත්‍යන්තරය තුළ ලොකු ඝෝෂාවක් නගන්නේ ඒ පිරිසයි. මේ පරාජයත් එක්ක ජාත්‍යන්තර වශයෙන් මේ උදව්යට ඒ රටවල්වල තිබුණු රැකවරණය නැතිවෙන්න පුළුවන්. ඒ අවදානම තියෙනවා. ඒ අය මේ මොහොතේ වැඩකරමින් ඉන්නේ ඒ සියල්ල ඇතුළෙයි.

චාමර ලක්ෂාන් කුමාර
chamara@rivira.lk